


# දයාව කරුණාව ඇති අල්ලාහ්

තව්හීද්, රිසාලත්, මආද් යන මූලික ඉස්ලාමීය විශ්වාසයන් අතර තව්හීද් ප්‍රධාන වේ. අල්ලාහ් ඒකයා වේ. කිසිවකට සම කළ නොහැකි අල්ලාහ්ට කිසිවකුගේ සහායක් අවශ්‍ය නොවේ. සියල්ලෙහි 'ඉලාහ්' ඔහු ය; 'රබ්බු' ද ඔහු ය. සියල්ල ඔහු මත රැඳී ඇත. එහෙත් ඔහු අන් කිසිවක් මත රඳා නොපවතී, යන ඒක දේව විශ්වාසය හා එම විශ්වාසයට අනුකූල ව ජීවත් වීම 'තව්හීද්' නම් වේ. තව්හීදයට පටහැනි සියලු විශ්වාස හා ක්‍රියාකාරකම් 'ෂිර්ක්' (සම කිරීම) යනුවෙන් හැඳින්වේ. මෙය අල්ලාහ් සමාව නොදෙන මහා පාපයකි.

"උදවු පතනවා නම් ඊට සුදුස්සා අල්ලාහ් පමණි" යන විශ්වාසයෙන් යුක්තව සෑම අවස්ථාවක දී ම ඔහුගෙන් ම අයැදීමෙන් පිළිඹිබු වන්නේ ඒක දේව විශ්වාසය වේ. මෙය අල්ලාහ් පමණක් නැමදීමට සමාන වූ ක්‍රියාවකි. මෙය අල්ලාහ් සෑම ගැත්තකුගෙන් ම පරිපූර්ණ ලෙස බලාපොරොත්තු වන්නේ ය. එනිසා සලාතයේ දී 'සූරතුල් ෆාතිහා' පාරායනය අනිවාර්ය කර එමගින් නැමදීම, උදවු පැතීම යන කරුණු දෙක සම්බන්ධ කර "ඔබ ම නමදිමු; ඔබගෙන් ම උදවු පතමු" යැයි සහතික වීම ගැත්තාගේ මුවින් දිනකට 17 වතාවක් කීමට සලස්වා ඇත්තේ ය.

අල්ලාහ් අල් කුර්ආනයේ ඊමාන්ධාරීන් දෙස බලා ඔහුගෙන් ම පමණක් උදවු පතන ලෙස අණ කරයි.

**"විශ්වාසවන්තයිනි! ඉවසීම හා සලාතය මගින් ඔබ අල්ලාහ්ගෙන් උදවු පතන්න, සැබැවින් ම අල්ලාහ් ඉවසිලිවන්තයින් සමග සිටින්නේ ය."** (2:153)

**තවද ඉවසීම හා නමස්කාරය මගින් පිහිට පතනු, ඇත්තෙන්ම නිහතමානීවන්නන්ට හැර මෙය දුෂ්කර දෙයකි.** (2:45)

අල්ලාහ්ගෙන් ම උදවු පැතිය යුතු ය, යන්න නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමන් ද අවධාරණය කර ඇත්තේ ය.

බලවත් මුඃමින් දුබල මුඃමින්ට වඩා අල්ලාහ්ට ඉතා සමීප ය. සියල්ලෙහි ම යහපතක් තිබේ. ඔබට ප්‍රයෝජනවත් කරුණුවල දී උනන්දුවක් දක්වන්න. අල්ලාහ්ගෙන් ම උදවු පතන්න. (කිසිවක් කිරීමට නොහැකි) දුබලයන් බවට පත්නොවන්න. (මුස්ලිම්)

## අල්ලාහ්ගෙන් පමණක් උදවු පැතිය යුත්තේ ඇයි?




අප අල්ලාහ් දයාව කරුණාව ඇත්තෙකි. උදව් පැතීමට සුදුස්සා ද ඔහු ම ය. මව දරුවා කෙරෙහි ආදරය දක්වයි. එනිසා දරුවා සැම විට ම මවගේ උදව්ව පතමින් පසුවෙයි. කරුණාවක් නැති අයගෙන් උදවු බලාපොරොත්තු වන විට, ඔවුන් අපගෙන් ප්‍රතිඋපකාර බලාපොරොත්තු වනු ඇත. නැතහොත් තමන් කරන උදව්ව මඟින් ඊට වැඩි යමක් බලාපොරොත්තු විය හැකි ය. එහෙත් කරුණා දයාව ඇති කෙනා මෙයින් ඔබ්බට ගොස්, තමන්ගෙන් උදවු පතන අයගේ යහපත පමණක් බලාපොරොත්තු වේ.

අප උදවු පැතීමට මුළුමනින් ම සුදුස්සා අල්ලාහ් ය. මක්නිසා ද යත් ඔහු අපරිමිත කරුණාව හා දයාව ඇත්තා ය. ඔහුගේ කරුණා දයාවට සමාන කරුණාවක් දක්වන අන් අයකු මෙලොවේ මෙන් ම පරලොවේ ද දැකිය නොහැකි ය.

නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණෝ මෙසේ පවසති:



"අල්ලාහ් තම කරුණා දයාව කොටස් 100කට බෙදා එයින් කොටස් 99ක් තමා සතු ව තබා මෙලොවට පහළ කළේ එක් කොටසක් පමණි. අල්ලාහ්ගේ මැවීම් තමන් අතර බෙදාගන්නේ එම කොටස යි. මව් අශ්වයා තම පැටවාගේ ශරීරයේ නොවදින ලෙස තම කකුල් ඔසවා ගැනීම ඉන් එකකි. " (බුහාරි, මුස්ලිම්)

තවත් එක් වාර්තාවක ඉතිරි කොටස් 99 කියාමා දිනයේ දී තම ගැත්තන් කෙරෙහි එළිදක්වන බව ද පැවසේ.

උමර් රළියල්ලාහු අන්හු තුමා මෙසේ පවසයි.

"වරක් නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණන් වෙත වහලුන් කිහිප දෙනෙක් ගෙන එනු ලැබූහ. ඔවුන් අතර ඔබ මොබ ඇවිදිමින් සිටි ගැහැනියක් දරුවකු දුටු වහාම

එම දරුවා ඔසවා තම පියයුරට ළංකර  කිරි පෙව්වා ය. මෙය දුටු නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණෝ "මෙම කාන්තාව කිසි ලෙසකින් වත් තමන්ගේ ම දරුවා ගින්නෙහි දමයි ද යි ඇසූහ. අපි එයට කිසිවිටෙකත් ඇය එසේ නොකරන බව කීවෙමු. එවිට නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමා, මෙම මව තම දරුවා කෙරෙහි තබා තිබෙන සෙනෙහසට වඩා අල්ලාහුතආලා තම ගැත්තන් කෙරෙහි සෙනෙහසින් සිටින බව කීවේ ය."(බුහාරි මුස්ලිම්)

නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමා පැවසූ බව බුහාරියේ ඇති තවත් වාර්තාවක "අල්ලාහ් මැවුම් සියල්ල මැවූ පසු තම ග්‍රන්ථයෙහි මාගේ  දයාව මාගේ කෝපය ඉක්මවා ගියේ ය" යි ලියූ බව දැක්වේ.

ඉහත 'හදීස්' අල්ලාහ්ගේ කරුණා දයාව පැහැදිලි කරන අතර අල්ලාහ්ගේ ශුද්ධ වූ නාමයන් ද ඔහු අපට ලබා දී ඇති දයාදයන් ද අල්ලාහ් අපට ලබා දී ඇති ආදරයට සාක්ෂි වශයෙන් පවතී.

අල්ලාහ්ගේ දයාව හෙළි කරන ශුද්ධ වූ නාමයන් මෙසේ ය.

| | |
|---|---|
| الرَّحْمٰنُ | අසීමිත කරුණාවන්තයා |
| الرَّحِيْمُ | අසමසම දයාවන්තයා |
| الرَّؤُوْفُ | අතිශයින් ම කරුණාව ඇත්තා |
| الْوَدُوْدُ | අතිශයින් ම ස්නේහය දක්වන්නා |
| الْغَفَّارُ | අතිශයින් සමා කරන්නා |
| التَّوَّابُ | අතිශයින් ම පව් සමාව පිළිගන්නා |

ඉහත සඳහන් ශුද්ධ වූ නාමයෙන් අල් කුර්ආනයේ තනි වචන වශයෙන් ද වාක්‍යාංශ වශයෙන් ද නැවත නැවත කියවේ.

අල් කුර්ආනයේ "අර් රහ්මාන්" යන තනි වචනය 169 වතාවක් ද, "අල් ගෆූරුර් රහීම්" යන්න 72 වතාවක් ද, "අත් තව්වාබුර් රහීම්" යන්න 8 වතාවක් ද, " අර් රඋෆුර් රහීම්" යන්න 8 වතාවක් ද කියවී තිබේ. අල්ලාහ් මෙම  ශුද්ධ වූ නාමයන් අල් කුර්ආනයේ නැවත නැවතත් දැක්වීමෙන් තම අසීමිත කරුණාව අවධාරණය කරයි.

### අල්ලාහ්ගේ කරුණා දයාවට සාක්ෂි වශයෙන් පවතින ඔහුගේ දයාද

අල්ලාහ් තම ගැත්තන්ට ලබා දී ඇති දයාද අසීමිත ය. ගණනය කළ නොහැක. මේ පිළිබඳව අල් කුර්ආනය පහත පරිදි පවසයි.

"...ඔබ අල්ලාහ්ගේ දයාද ගණන් කළ ද ඔබට ඒවා ගණන් කර අවසන් කළ නොහැක..." (14:34) (16:18)




## අල්ලාහ්ගේ දයාද යනු කුමක් ද?

සජීවී සෑම ජීවියෙක් ම තම මවගේ ගර්භාෂයේ ගැබ් ගත් ද පටන් මරණයට පත්වන තෙක් විඳින සියලු ම සම්පත් එනම්, ශ්වසනය කරන වාතය ද, පානය කරන ජලය ද, කන බොන දේවල් ආහාර හා ඇඳුම් පැලඳුම්වලට පදනම් වන සම්පත් හා අපගේ සෑම ශරීර අවයවයක් ම අල්ලාහ්ගේ දයාද ය. තව ද භූමියේ වැළලී තිබෙන ඛනිජ වර්ග, අහසේ තිබෙන තාරකාවන් ද, සාගරය පුරා ජීවත් වන ජීවීන් යනාදී මේ සියල්ල අල්ලාහ්ගේ දයාද ය.

ගවයා කිරි දෙන්නේ ද, කිකිළිය බිත්තර දමන්නේ ද, රෑ දවල් මාරුවෙන් මාරුවට ඇති වන්නේ ද, ගස්වැල් වැඩෙන්නේ ද අල්ලාහ්ගේ දයාද ලෙස ය.

අල්ලාහ්ගේ දයාද පිළිබඳව අල් කුර්ආනයේ වැඩි වශයෙන් සඳහන් වේ. අල්ලාහ්ගේ දයාවට සාක්ෂි වශයෙන් පවතින මැවීම් පිළිබඳ පර්යේෂණය කර අල්ලාහ් කෙරෙහි පමණක් විශ්වාසය තබා, ඔහු කෙරෙහි පමණක් මුළුමනින් ම යැපෙමින් ජීවත් විය යුතු ය බව ඉස්ලාම් අපේක්ෂා කරයි.-

**"එහි නුඹලාට ගිමන් හැරීමට හැකිවනු පිණිසද ඔහුගේ වරප්‍රසාදයන් නුඹලා සොයා ගනු පිණිස ද නුඹලා ගුණ ගරුක වනු පිණිසද රාත්‍රිය සහ දහවල නුඹලාට ඇති කළේ ඔහුගේ දයාලුභාවයෙනි."** (28 : 73)

**"තවද භීතිය සහ බලාපොරොත්තුව ජනනය කිරීමක් ලෙස නුඹලාට විදුලිය (කෙටීම) දැක්වීම ද, අහසින් වැසි ජලය එවීම ද, නිසරු මහපොළොව එමගින් යළි සාරවත් වීම ද, ඔහුගේ සංඥාවන්ගෙන්ය. වටහා ගන්නා ජනයාට නියත වශයෙන් එහි සංඥා ඇත."** (30 : 24)

මිනිසාගේ මෙලොව දිවියට අත්‍යවශ්‍ය ජලය, වාතය වැනි දේ අල්ලාහ්ගේ අතිමහත් දයාදයන් ය. ඔහු ඒවා මිනිසාට ප්‍රයෝජනවත් වන අයුරින් මිල මුදලකින් තොරව නොමිලේ සපයයි. අල්ලාහ් පැතුවේ නම් ඉතා අසීරුවෙන් සොයා ලබාගත යුතු දෙයක් ලෙසට ජලය පත් කරන්නට තිබුණි. නැතහොත් අප්‍රයෝජනවත් කරදිය වැඩි වස්සවන්නට තිබුණි. මේ සියල්ල අල්ලාහ්ට ඉතාමත් සරල ය. එහෙත් තමාගේ මැවීම් කෙරෙහි ඔහුගේ දයාව නිසා මැවුම්වල අවශ්‍යතා අනුව තම දයාද ලබා දෙමින් සිටින්නේ ය.

අල්ලාහ් මෙසේ පවසයි, **" ඔබ පානය කරන ජලය දෙස බලන්න. වලාකුළුවලින් එය ඔබ වහින්නට සලස්වනවා ද නැතහොත් අප වස්සනවා ද? අප සිතුවේ නම් එය (ඔබට පානය) කළ නොහැකි කරදිය වශයෙන් පත්කරන්නට තිබුණි. මෙයට ඔබ කෘතඥ නොවන්නේ ද?** (56 : 6870)




ඉහත සඳහන් සියල්ල අල්ලාහ්ගේ ආදරයට හා හැකියාවට සාධක වශයෙන් පවතී. අපගේ අවශ්‍යතා සියල්ල ඉටු කර දීමට සමත් වන්නේ මෙවැනි ශක්තියක් හා හැකියාවක් ඇති අල්ලාහ් පමණි, එනිසා බුද්ධිමත් ක්‍රියාව වනුයේ ඔහු කෙරෙහි විශ්වාසය තබා ඔහුගෙන් ම දෑත් ඔසවා උදවු පැතීම ය.  අල්ලාහ් අපගෙන් බලාපොරොත්තු වන්නේ ද එය යි.

අල්ලාහ්ගෙන් උදවු පතන විට කරුණු දෙකක් පිළිබඳව සැලකිලිමත් විය යුතුයි.

## 01. අල්ලාහ්ගෙන් උදවු පැතීම සම්බන්ධයෙන් පසුබට නොවීම.

අල්ලාහ් දයාවන්ත වන්නාක් සේම ඔහු ගැත්තන්ගේ ද භක්ති ආදරය අපේක්ෂා කරයි.අල්ලාහ් කෙරෙහි දැඩිව විශ්වාසය තැබීම ද අනලස් ව ඔහු වෙතින් ඉල්ලීම ද ඔහු කෙරෙහිවූ භක්ති ආදරයහි පිළබිඹුවක් වේ. එම නිසා අපි අල්ලාහ් වෙතින් ප්‍රාර්ථනා කිරීම ද අපගේ පාපයන්ට ක්ෂමාව ඉල්ලීමට ද විශ්වාසය කඩවීම හෝ පසු බට වීම හෝ  සිදු නොවිය යුතුය.

අල්ලාහ් පවසයි.

لَا تَقْنَطُوا مِنْ رَحْمَةِ اللَّهِ

" අල්ලාහ්ගේ දයාදයන් කෙරෙහි ඔබ අවිශ්වාස නොකරන්න." (39:53)




## 02. සබබ් අනුගමනය කිරීම.

මෙලොව සිදු වන කාර්යයන් සියල්ල අල්ලාහ්ගේ නියමයන්ට අනුකූලව ම සිදු වන්නේ ය. රාත්‍රිය සහ දහවල මාරුවෙන් මාරුවට ඇතිවීමට පෘථිවිය තම අක්ෂය වටා භ්‍රමණය වීම, රෝග සුව වීමට බෙහෙත් ගැනීම, විභාග සමත් වීමට හොඳින් ඉගෙන ගැනීම වැනි නියමයන් සබබ් ලෙස සැලකේ.

අප අල්ලාහ්ගෙන් උදවු පතන අතර ම සුදුසු 'සබබ්' කළ යුතු බව ඉස්ලාමීය ෂරීආව අපට පෙන්වා දෙයි. නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණෝ "ඔටුවා බැඳ තබන්න, පසුව අල්ලාහ් වෙත පවරන්න" යැයි පවසා ඇත්තේ ද එනිසා ය. නමුත් අල්ලාහ් මගහැර 'සබබ්' කෙරෙහි පමණක් විශ්වාසය තැබීම අල්ලාහ්ට සමකිරීම වන්නේ ය. හේතුව සබබ්වලට කිසි දු හැකියාවක් හෝ ශක්තියක් නොමැති වීම ය. හැකියාව හා ශක්තිය ඇත්තේ අල්ලාහ්ට පමණි. 'සබබ්' ක්‍රියාත්මක වන්නේ ඔහුගේ අණ පරිදි ය. එනිසා අප අල්ලාහ් කෙරෙහි විශ්වාසය තබා සුදුසු සබබ් ඉටුකර ඔහුගෙන් උදවු පැතිය යුතු ය.

### අල්ලාහ්ගේ උදවු පැතීම නිසා අත් වන ප්‍රයෝජන

1. අල්ලාහ් සුදුසු 'සබබ්' වෙත යොමු කරන්නේ ය.
2. අල්ලාහ්ගේ සමීපතාව හා තෘප්තිය ලැබේ.
3. අපගේ ගෞරවය සුරකේ.
4. අපගේ පැතුම්වල යහපත හා අයහපත අල්ලාහ් දනී. ඔහු අප අයහපතින් ආරක්ෂා කරයි.
5. අල්ලාහ්ට යාඥා කිරීමෙන් ද කුසලයන් හිමි වේ.
6. අල්ලාහ් ලබා දෙන තෙක් ඉවසා සිටීම මගින් කුසලයන් හිමි වේ.

### පාඩමේ ඇතුළත් වැදගත් අරාබි වචන

تَوْحِيْد رِسَالَة مَعَاد إِلٰه رَبّ شِرْكٌ الرَّحْمٰنُ غَفُوْرٌ

رَؤُوْفٌ التَّوَّابُ الرَّحِيْمُ سَبَبٌ الشَّرِيْعَةُ

## අභ්‍යාස

පහත වැකිවල ඇති වැරැදි අදහස් නිවැරැදි කර නැවත ලියන්න.

1. 'තව්හීදයට' පටහැනි සියල්ල ඊමාන් වේ.
2. අල්ලාහ් වෙත හා අනෙකුත් මැවීම් වෙත දෑත් ඔසවා උදවු පැතීම 'තව්හීදයේ' සැබෑ මුහුණුවර වේ.
3. මව දරුවන්ට සෙනෙහස දක්වන අයුරින් අල්ලාහ් තම ගැත්තන්ට සෙනෙහස දක්වයි.
4. ආශ්වාස කරන වාතය, පානය කරන ජලය, ආහාර වස්ත්‍ර යනාදී සියල්ල පදනම් වන සම්පත් ස්වාභාවික සම්පත් වේ.
5. අල්ලාහ් කෙරෙහි පමණක් විශ්වාසය තැබිය යුතු බවටත්, 'සබබ්' පමණක් විශ්වාස නොකළ යුතු බවටත් ඉස්ලාම් දහම මග පෙන්වයි.

පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

1. ඉස්ලාමයේ මූලික විශ්වාසයන් තුන මොනවා ද?
2. අප දිනකට 17 වතාවක් අල්ලාහ් හට සහතික වන්නේ කුමක් ද?
3. "අල්ලාහ් දයාවන්ත ය" යන්නට ඇති සාධක දෙකක් සපයන්න.
4. අල්ලාහ් වෙතින් පමණක් උදවු පැතීමෙහි ඇති ප්‍රයෝජන හතරක් ලියන්න.